ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1984 අංක 7 දරන
# ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.45 යි　　　තැපැල් ගාස්තුව : ශත 90 යි

## 1984 අංක 7 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 31 වන දින.]

**එල්. ඩී.—ඕ. 21/82.**

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1984 අංක 7 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 51 දරන පනතේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" වරායවල් පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය.

5. (1) වරායවල් පිළිබඳ අධිකාරියෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුත්තේ ය :—

(අ) වරාය සංවර්ධනය හෝ වරායවල් මෙහෙය වීම් පිළිබඳව හෝ නෛතික හෝ මූල්‍ය කරුණු පිළිබඳව හෝ නාවික, වාණිජ හෝ ඉංජිනේරු කටයුතු පිළිබඳව හෝ පරිපාලනය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳව හෝ පුළුල් පළපුරුද්දක් ඇතැයි සහ නිපුණත්වයක් දක්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සභාපතිවරයා සහ එසේම පත් කරනු ලැබිය යුතු වෙනත් අධ්‍යක්ෂවරයන් හතර දෙනෙක් ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් ;

(ඇ) 13 වන වගන්තිය යටතේ පත් කරනු ලබන කළමනාකාර අධ්‍යක්ෂවරයා ;

(ඈ) ප්‍රධාන ඉංජිනේරු අයකැමිවරයා ; සහ

(ඉ) ධීවර කටයුතු විෂයය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා භාරයේ ඇති අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

(2) (1) (අ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ආ) වන උපවගන්තිය යටතේ හෝ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් අතුරෙන් සභාපතිවරයා නොවන අධ්‍යක්ෂවරයකු වරායවල් පිළිබඳ අධිකාරියේ උපසභාපතිවරයා වශයෙන්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ 1 වන උපලේඛනයේ විධිවිධාන, වරායවල් පිළිබඳ අධිකාරිය සම්බන්ධයෙන් බලපැවැත්විය යුතු ය.".

2—ඒ 073991—7,750 (83/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ " යම් සාමාජිකයකුට " යන වචන වෙනුවට " යම් අධ්‍යක්ෂවරයකුට " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "විධාන කළ හැකි අතර" යන වචන වෙනුවට " ලියවිල්ලකින් විධාන කළ හැකි අතර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) " සියලු සාමාජිකයන් " යන වචන වෙනුවට " සියලු අධ්‍යක්ෂවරයන් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි " සාමාජිකයන් " යන වචනය වෙනුවට " අධ්‍යක්ෂවරයන් " යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" කළමනාකාර අධ්‍යක්ෂවරයා.

13. (1) අමාත්‍යවරයා විසින්, ප්‍රවීණ හා පළපුරුදු තැනැත්තකු, කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබිය යුතුය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු මෙහෙයවීම ද, වරායවල් පිළිබඳ අධිකාරිය සංවිධානය කිරීම ද එහි බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ද ඒ අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාන්‍ය විධානවලට යටත්ව හා සභාපතිවරයාගේ විශේෂ විධානවලට යටත් ව කළමනාකාර අධ්‍යක්ෂවරයාට භාර වන්නේ ය.

(3) තමාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් වරායවල් පිළිබඳ අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි කළමනාකාර අධ්‍යක්ෂවරයා කලින් කල සලකන බලතල, කාර්ය හෝ කර්තව්‍ය වරායවල් පිළිබඳ අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින්, ඒ සේවා නියුක්තයාට, ලියවිල්ලකින් පැවරිය හැකි අතර, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින්, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) කළමනාකාර අධ්‍යක්ෂවරයා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටී නම් හෝ රෝගාතුර වීම නිසා තාවකාලික ව අබල ව සිටී නම් හෝ වෙනත් හේතු නිසා ස්වකීය කාර්ය ඉටු කිරීමට තාවකාලික ව නොහැකි ව සිටී නම්, ඔහුට නැවත තම කාර්ය ඉටු කිරීමට හැකිවන තුරු කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම පිණිස, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය. ".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1981 ජූනි මස පළමුවන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල " මුදල් කළමනාකාරවරයා " යන වචන වෙනුවට " ප්‍රධාන මුදල් කළමනාකාරවරයා " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි " මුදල් කළමනාකාරවරයා " යන වචන වෙනුවට " ප්‍රධාන මුදල් කළමනාකාරවරයා " යන වචන ආදේශ කිරීමෙන්.

8. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 14අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" වරාය අධිපති සහ නියෝජ්‍ය වරාය අධිපති.

14අ. (1) මේ පනතේ මූල ධර්ම හා විධිවිධාන ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා වරාය අධිපතිවරයකු සහ නියෝජ්‍ය වරාය අධිපතිවරුන් අවශ්‍ය සංඛ්‍යාවක් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) යම්කිසි ලිඛිත නීතියක නැව්තොට සංවිධායක පිළිබඳව ඇති යම් සඳහනක් වරාය අධිපති පිළිබඳව ඇති සඳහනක් ලෙස සැලකිය යුතු ය. ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි " කොළඹ වරාය කොමිෂන් සභාවේ " යන වචන වෙනුවට " කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සත්වෑට සංඥා එළි අංශයේ " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " කොළඹ වරාය කොමිෂන් සභාවේ " යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට " කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ

වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥා එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි, "කොළඹ වරාය කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥා එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(5) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් රජයේ නිලධරයකු (4) වන උපවගන්තිය යටතේ වරාය වල් පිළිබඳ අධිකාරියේ ස්ථිර සේවානියුක්තිය භාර නොගත් නා අවස්ථාවක, ඒ සේවානියුක්තිය අවසන් කරන්නට යෙදුණේ වී නමුත්, ඒ අධිකාරිය විසින් පනවනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට යටත්ව, ඒ නිලධරයාට අධිකාරිය විසින් තාවකාලික සේවානියුක්තිය පිරිනමනු ලැබිය හැකි ය :

එසේ වුව ද වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සේවානියුක්ත කරන ලද එවැනි යම් නිලධරයකුට විරුද්ධව යම් විනයානුකූල පරීක්ෂණයක් පවතින්නාවූ හෝ පැවතුනාවූ අවස්ථාවක, අධිකාරිය විසින්, යම් පරීක්ෂණයක් පවත්වා ඒ නිලධරයාගේ සේවය අවසන් කිරීම හෝ ඒ නිලධරයාගේ සේවා කොන්දේසි වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය." ; තවද

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොළඹ වරාය කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥා එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි, "කොළඹ වරාය කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥා එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොළඹ වරාය කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥා එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය එහි (1) වන උප වගන්තියේ "කොළඹ වරාය කොමිෂන් සභාවේ" යන වචන වෙනුවට "කොළඹ වරාය කොමිෂන් සභාවේ සහ වෙළෙඳ නැව් කටයුතු දෙපාර්තමේන්තුවේ වෙරළබඩ පහන් සහ සන්වැට සංඥ එළි අංශයේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"සේවය අවසන් කිරීම පිළිබඳ විධිවිධාන.

22අ. වරායවල් පිළිබඳ අධිකාරියේ යම් සේවා නියුක්තයකුගේ සේවය විෂමාචාරය හැර වෙනත් යම් හේතුවක් මත අවසන් කිරීමට ඇති අවස්ථාවක, එසේ සේවය අවසන් කිරීම පිළිබඳව එසේ සේවය අවසන් කරන දිනයට යටත් පිරිසෙයින් එක් මාසයකට පෙර වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඒ සේවා නියුක්තයාට දැනුම් දීමක් කළ යුතු ය. නැතහොත් ඒ දැනුම්දීම වෙනුවට, ඒ අධිකාරිය විසින් ඔහුට එක් මාසයක වැටුප හෝ වේතනය ගෙවිය යුතුය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වරාය කොමසාරිස් වරයා විසින් දරන්නා වූ හා වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ වද්පළ වරායවල් පිළිබද අධිකාරියට පැවරීම.

23. (1) කොළඹ, ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායවල් ඇතුළත පිහිටි සියලු රජයේ ඉඩම් ද, වරාය කොමසාරිස්වරයා විසින් දරනු ලබන හෝ පාලනය කරනු ලබන, වෙනත් යම් ස්ථානවල පිහිටි සියලු රජයේ ඉඩම් ද, වරාය කොමසාරිස්වරයා විසින් දරනු ලබන්නා වූ හෝ වරාය කොමසාරිස්වරයාගේ සන්තකයේ ඇත්තා වූ (මුදල් ද ඇතුළුව) සියලු චංචල දේපළ ද, නියමිත දිනයට පෙරාතුව ම දින යේ දී වරාය කොමසාරිස්වරයා, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව සතුව පැවතුනා වූ සියලු වත්කම්, බල තල, අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද ද ඇතුළුව වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ (අරමුදල් වල මුදල් ද ඇතුළුව) සියලු චංචල හා නිශ්චල දේපළ ද නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි වරායවල් පිළිබඳ අධිකාරියට පවරනු ලැබිය යුතු අතර ඒවා වරායවල් පිළිබඳ අධිකාරිය සතු විය යුතු ය.

(2) එසේ පවරනු ලැබූ විට, (1) වන උපවගන්තියේ සඳහන් රජයේ දේපළවලට, වරාය කොමසාරිස්වරයාගේ දේපළවලට, වරාය (නැව්බඩු) සංස්ථාවේ දේපළවලට සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ දේපළවලට සම්බන්ධ

වූ හෝ අදාළ වූ සියලු ණය, බැරකම් සහ බැඳීම් ද වරායවල් පිළිබඳ අධිකාරියට පැවරෙන අතර ඒවා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් දරන ලද ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "ජනරජයේ යම් ඉඩමක්" යන වචන වෙනුවට, "රජයේ යම් ඉඩමක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි එන, "ජනරජයේ යම් ඉඩමක්" යන වචන වෙනුවට, "රජයේ යම් ඉඩමක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(i) "ජනරජයේ දේපළක් නොවන යම් නිශ්චල දේපළක්" යන වචන වෙනුවට "රජයේ ඉඩමක් නොවන යම් ඉඩමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) "ඒ දේපළ" යන වචන වෙනුවට "ඒ ඉඩම" යන වචන ද "දේපළක්" යන වචනය වෙනුවට "ඉඩමක්" යන වචනය ද ආදේශ කිරීමෙන්.

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "යම් නිශ්චල දේපළක්" යන වචන වෙනුවට "යම් ඉඩමක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි (3) වන (4) වන සහ (5) වන උපවගන්ති ඉවත්කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) ගොඩබෑමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ඒ බඩු ගොඩ බෑ විගාම හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නිශ්චය කරන පරිදි බඩු ගොඩබෑමට පෙරවූ හෝ පසු වූ යම් කාලසීමාවක් ඇතුළත ගෙවිය යුතු වන්නේ ය.

(4) නැව්ගත කරනු ලැබීමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ඒ බඩු නැව්ගත කිරීමට පෙර හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නිශ්චය කරන පරිදි, ඒ බඩු නැව්ගත කිරීමෙන් පසු යම් කාලසීමාවක් ඇතුළත හෝ ගෙවිය යුතු වන්නේ ය.

(5) වරායවල් පිළිබඳ අධිකාරියේ භූමියෙන් ඉවත් කිරීමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු, ඒ බඩු ඒ භූමියෙන් ඉවත් කිරීමට පෙර, ඉල්ලා සිටි විට හෝ, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නිශ්චය කරන පරිදි ඒ බඩු භූමියෙන් ඉවත් කිරීමෙන් පසු යම් කාල සීමාවක් ඇතුළත හෝ ගෙවිය යුතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය, එහි (1) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) යම් වරාය සේවා සම්බන්ධයෙන් හෝ යම් බඩු සම්බන්ධයෙන් හෝ ප්‍රේෂණ ලාභියා, ප්‍රේෂණකරු, ආනයනකරු, අපනයනකරු, නැව්ගත කරන්නා නැතහොත් ඒ බඩුවල අයිතිකරු විසින් හෝ වෙනුවෙන් හෝ යම් යාත්‍රාවක නෞකාධිපති හෝ අයිතිකරු නැතහොත් ඒ නෞකාධිපතිගේ හෝ අයිතිකරුගේ අනුයෝජිතයා විසින් හෝ වෙනුවෙන්, වරායවල් පිළිබඳ අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක යම් අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් ඇතුළත් වී තිබෙන්නාවූ අවස්ථාවක, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද ඒ සේවාව හෝ ඒ බඩු සඳහා සාමාන්‍යයෙන් අයකරන ගාස්තුව මෙන් දෙගුණයක් ගෙවන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රේෂණලාභියාට, ප්‍රේෂණකරුට, ආනයනකරුට, අපනයනකරුට, නැව්ගත කරන්නාට නැතහොත් ඒ බඩුවල අයිතිකරුට හෝ එවැනි යම් යාත්‍රාවක නෞකාධිපතිට හෝ අයිතිකරුට නැතහොත් ඒ නෞකාධිපතිගේ හෝ අයිතිකරුගේ අනුයෝජිතයාට වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 42අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**19.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 42අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"අයකර ගැනීමේ කාර්ය පරිපාටිය.

42අ. (1) අවස්ථාවෝචිත පරිදි, ප්‍රේෂණලාභියා, ප්‍රේෂණකරු, ආනයනකරු, අපනයනකරු, නැව්ගත කරන්නා, බඩු අයිතිකරු නැතහොත් යම් යාත්‍රාවක නෞකාධිපති හෝ අයිතිකරු නැතහොත් ඒ නෞකාධිපතිගේ හෝ අයිතිකරුගේ අනුයෝජිතයා අධිකාරියට ආයවිය යුතු යම් මුදලක් ගෙවීම ප්‍රතික්ෂේප කළහොත්, පැහැර හැරියහොත් හෝ නොසලකා හැරියහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රේෂණලාභියා, ප්‍රේෂණකරු, ආනයනකරු, අපනයනකරු, නැව්ගත කරන්නා, බඩු අයිතිකරු නැතහොත් එවැනි යම් යාත්‍රාවක නෞකාධිපති හෝ අයිතිකරු නැතහොත් ඒ නෞකාධිපතිගේ හෝ අයිතිකරුගේ අනුයෝජිතයා වෙත, ඔහුගේ අන්තිමට දැනගන්නට ඇති ලිපිනයට තැපැල් කරනු ලැබිය යුතු වූ සහතිකයක් මගින්, අයවිය යුතු ගාස්තුව, අධිකාරිය විසින් දන්වනු ලැබිය යුතු අතර, ඒ සහතිකය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(2) ඒ සහතිකයෙන් අතෘප්ත යම් තැනැත්තකු විසින්, ඒ සහතිකය තැපැල් කරනු ලැබීමෙන් දින තිහක කාලසීමාවක් ඇතුළත, ඒ තැනැත්තා පදිංචිව සිටින්නා වූ හෝ ඒ තැනැත්තාට අයත් යම් චංචල

හෝ නිශ්චල දේපළක් පිහිටා ඇත්තා වූ යම් දිස්ත්‍රික්කයක් කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත අධිකරණයට ඉල්ලීමක් කරනු නො ලැබූ අවස්ථාවක අයවිය යුතු ඒ මුදල ණයක් ලෙස අයකර ගැනීමට අධිකාරියට හිමිකමක් ඇති අතර, ඒ තැනැත්තාට අයත් සියලු චංචල හා නිශ්චල දේපළ හෝ ඉන් යම් දේපළක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ඉන් යම් කොටසක් හෝ තහනමට ගෙන විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල්වරයාට නිකුත් කරන ලෙස, අධිකරණය විසින් විධාන කළ යුතු අතර, රිට් ආඥාව ක්‍රියාත්මක කිරීම සහ දේපළ තහනමට ගෙන විකිණීම කෙරෙහි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය ; තව ද, වෙනත් යම් නඩු කටයුත්තක් මගින් එකී ගාස්තු හෝ ඉන් යම් කොටසක් අයකර ගැනීමට වරායවල් පිළිබඳ අධිකාරියට ඇති අයිතිවාසිකම්වල බලය මේ පනතේ ඇතුළත් කිසිවකින් හීන කෙරෙතැයි නොසැලකිය යුතු ය :

එසේ වුව ද, ආනයනය කෙරෙන හෝ අපනයනය කිරීමට ඇති හා රේගු නිදහස් කිරීම ලැබී නොමැති නැව්බඩුවලට හෝ රේගු ආඥාපනත යටතේ තහනමට ගැනීමට යටත් නැව් බඩුවලට හෝ මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

“ (2) දුර්දෛවය, යුද්ධය, සිවිල් යුද්ධය, ජන කැලඹීම්, වැඩ වර්ජනය හෝ පිට ලෑම හේතු කොට ගෙන එවැනි බඩු නැතිවීම හෝ එවැනි බඩුවලට හානිවීම සම්බන්ධයෙන් අයිතිකරුට, ආනයනකරුට, අපනයනකරුට, නැව් ගත කරන්නාට හෝ ප්‍රේෂණ ලාභියාට වරායවල් පිළිබඳ අධිකාරියෙන් කිසිම හිමිකම් පෑමක් කළ නොහැකි විය යුතුය. ”

ප්‍රධාන ප්‍රඥප්තියේ 61අ සහ 61ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කෙරෙන අතර ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 61අ සහ 61ආ වන වගන්ති ලෙස බල පැවැත්විය යුතු ය :—

"පීඩාකාරී ආයුධ, පුපුරණ ද්‍රව්‍ය ආදිය සන්තකයේ තබා ගැනීම.

61අ. (1) යම් නිශ්චිත වරායක සීමා ඇතුළත හෝ ඒ වරායකට ඇතුළු වන ස්ථානයේ, නීත්‍යානුකූල බලයක් නොමැතිව යම් තුවක්කුවක් හෝ යම් තහනම් පිහියක් හෝ ගෙනයන, නැතහොත් යම් අන තුරුදායක හෝ පීඩාකාරී ආයුධයක් හෝ වෙඩි ද්‍රව්‍ය හෝ පුපුරණ ද්‍රව්‍ය තමා සන්තකයේ තබා ගෙන අසු වන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරද කරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම සහ අවස්ථෝචිත පරිදි ඒ තුවක්කුව, තහනම් පිහිය, වෙඩි ද්‍රව්‍ය හෝ පුපුරණ ද්‍රව්‍ය රජය සන්තක කරනු ලැබීමට, ඒ දඬුවම මහෙස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවන්නේ වුවද, යටත් වන්නේ ය.

(2) මේ වගන්තිය යටතේ වූ වරදක්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව, සංඥේය වරදක් සේ සැලකිය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

(i) "තුවක්කුව" යන්නට තුවක්කු ආඥා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය;

(ii) "තහනම් පිහිය" යන්නට අන්තරාදායක පිහියා ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

(iii) "පීඩාකාරී ආයුධය" යන්නට 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය; තව ද

(iv) "පුපුරණ ද්‍රව්‍ය" යන්නට පුපුරණ ද්‍රව්‍ය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

61අ හෝ 66උ වන වගන්ති යටතේ වූ වැරදිවලට වරදකරු කරනු ලැබූ හෝ වරදකරු බවට තීරණය කරනු ලැබූ තැනැත්තන්ට අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවන බව.

61ආ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන් ව ඇත ද, මේ පනතේ 61අ වන හෝ 66උ වන වගන්ති යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කවර වූ හෝ අධිකරණයක් විසින් නැතහොත් ඉදිරිපිට—

(අ) වරදකරු කරනු ලබන කිසිම තැනැත්තකු සම්බන්ධයෙන් ඒ පනතේ 303 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය;

(ආ) තමා වරදකරු යයි උත්තරවාද දෙන හෝ වරදකරු බව තීරණය කරනු ලබන කිසිම තැනැත්තකු සම්බන්ධයෙන් ඒ පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.**

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය, එහි (2) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) කවර හෝ කාරණයක් පිළිබඳව විමර්ශනය කිරීම හා පරීක්ෂණ පැවැත්වීම, වරායවල් පිළිබඳ අධිකාරිය හා සම්බන්ධ වූ ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII වන පරිච්ඡේදය යටතේ වූ ද නඩු මෙහෙයවීමට තත් කාර්යය සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් බලය දෙනු ලැබූ ඒ අධිකාරියේ සේවා නියුක්තයකු විසින් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66අ, 66ආ, 66ඇ, 66ඈ, 66ඉ, 66ඊ, 66උ, 66ඌ, 66එ, 66ඒ සහ 66ඔ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 66අ, 66ආ, 66ඇ, 66ඈ, 66ඉ, 66ඊ, 66උ, 66ඌ, 66එ, 66ඒ සහ 66ඔ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

**"රජය සතු කරනු ලැබීමට යටත් දේපළ තහනමට ගැනීම.**

66අ. (1) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ යම් වරදක් කර ඇති බව විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, ඒ වරද කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලු උපකරණ, මෙවලම්, කරත්ත, යාත්‍රා, තුවක්කු, ආම්පන්න, වස්ත්‍ර, මෝටර් වාහන සහ වෙනත් වාහන විශේෂ ද යම් භාණ්ඩ වෙතොත් ඒවා ද, තත් කාර්යය සඳහා යථා පරිදි ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වරායවල් පිළිබඳ අධිකාරියේ නිලධරයකු විසින් වරායවල් පිළිබඳ අධිකාරියට අයත් ප්‍රදේශය ඇතුළත දී තහනමට ගතහැකි අතර ඒ නිලධරයා විසින් ඒ දේපළවල සන්තකය දැරූ තැනැත්තා රඳවා තබාගෙන ඒ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානයට භාර දිය යුතු ය :

එසේ වුව ද එවැනි යම් වරදක් කිරීමෙහි ලා පාවිච්චි කරන ලද එවැනි උපකරණ, මෙවලම්, කරත්ත, යාත්‍රා, තුවක්කු, ආම්පන්න, වස්ත්‍ර, මෝටර් වාහන හෝ වෙනත් වාහන විශේෂය රේගු ආඥාපනත යටතේ තහනමට ගැනීමට යටත් වන්නේ නම්, ඒවා තහනමට නොගත යුතු ය.

(2) යම් දේපලක් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ අවස්ථාවක, නඩු පැවරීමේ දී ඒ දේපල අධිකාරිය විසින් ඉදිරිපත් කළ යුතු අතර ඒ නඩු කටයුතු අවසාන වනතෙක් ඒවායේ භාරය දැරීමටත් අධිකරණය විසින් නියම කරනු ලැබූ අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමටත් අධිකරණය විසින් අධිකාරියට අවසර දිය හැකි ය.

තහනමට ගැනීමේ කාර්ය පටිපාටිය.

66ආ. 66අ වන වගන්තියේ සඳහන් යම් දේපලක් තහනමට ගන්නා සෑම නිලධරයකු විසින්ම, ඒ දේපල මත හෝ ඒ දේපල අන්තර්ගත ග්‍රාහක යක් වෙතොත් ඒ මත, එය එසේ තහනමට ගන්නා ලද බවට ලකුණක් තැබිය යුතු අතර, ඔහු විසින් හැකිතාක් ඉක්මණින්, එයට අදාල අවස්ථා ගත කරුණු පිළිබඳව වරායවල් පිළිබඳ අධිකාරියට වාර්තාවක් සැපයිය යුතු ය. ඒ වාර්තාව ලැබුණු විට, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එය ඒ වරද පිළිබඳව නඩු විභාග කිරීමට අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු අතර, එම නඩුව විභාග කර තීන්දුව දීමටත් නීතිය අනුව ඒ දේපල පිළිබඳව සුදුස් සක් කිරීම ටත් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

වාහනය, බඩු ආදිය රජය සතු කිරීමට අධිකරණයට ඇති බලය.

66ඇ. යම් තැනැත්තකු මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ හෝ ගැනෙන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, යම් වරදක් කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලු උපකරණ, මෙවලම්, කරත්ත, යාත්‍රා, තුවක්කු, ආම්පන්න, වස්ත්‍ර, මෝටර් වාහන සහ වෙනත් වාහන විශේෂ ද යම් භාණ්ඩ වෙතොත් ඒවාද සමග යම් බඩු සඟවා තැබීම හෝ ඉවත් කිරීම සඳහා පාවිච්චි කරන ලද වෙනත් සියලු දේ ද ඒ වරදකරු කිරීම කරන මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාව අනුව රජය සන්තක කරනු ලැබීමට යටත් වන්නේ ය. ඒ රජය සන්තක කිරීම, ඒ වරදට නියම කර ඇති වෙනත් යම් දඬුවමකට අතිරේකව විය යුතු ය.

නඩු විභාගය නිම වූ විට දේපල පිළිබඳව සුදුස් සක් කිරීම.

66ඈ. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීති යක් යටතේ හෝ වූ වරදක් පිළිබඳ නඩු විභාග යක් නිම කරනු ලැබූ විට, රජය සන්තක කරනු ලැබූ දේපලවල සන්තකය, තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ වරායවල් පිළිබඳ අධි කාරියේ නිලධරයකු විසින් ලබාගෙන, අධිකරණය ආඥා කරන ආකාරයකට ඒවා පිළිබඳව සුදුස් සක් කළ හැකි ය.

**වරායවල් පිළිබඳ අධිකාරිය වෙත දේපළ සතුවන අවස්ථා.**

66ඉ. යම් දේපළක් රජය සන්තක කිරීමට ආඥාවක් කරනු ලැබ ඇත්තා වූ ද අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ හෝ අභියාචනයක් කරන ලදුව ආඥාව ස්ථිර කර ඇත්තා වූ ද අවස්ථාවක, රජය සන්තක කරනු ලැබූ දේපළ සියලු බැඳීම්වලින් නිදහස්ව වරායවල් පිළිබඳ අධිකාරිය වෙත සතු වන්නේ ය.

**වරදක් කිරීම වැළැක්වීමට බලයලත් නිලධරයාට බලය ඇති බව.**

66ඊ. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් යටතේ හෝ ගැනෙන යම් වරදක් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ අධිකාරියේ යම් සේවා නියුක්තයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ වැළැක්විය යුතු ය.

**වැරදි සමථයකට පත් කිරීම.**

66උ. (1) මේ පනත යටතේ වූ හෝ මේ පනත යටතේ සාදන ලද රීතියක් හෝ නියෝගයක් යටතේ වූ වරදක්, ඒ වරද කරන ලද්දේ කවර අවස්ථාගත කරුණු යටතේ ද යන වග සහ වරදේ බරපතලකම සැලකිල්ලට ගනිමින්, ඒ වරද සම්බන්ධයෙන් නියම කළ හැකි උපරිම දඩ මුදලින් පහෙන් එකකට නොඅඩු මුදලකට සමාන මුදලකට සමථයට පත් කිරීම තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ වරායවල් පිළිබඳ අධිකාරියේ සේවා නියුක්තයකු විසින් කළ හැකි අතර, 66අ වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගන්නා ලද යම් දෙයක් මුදා හරින ලෙස නියම කිරීම ද ඒ වරද සමථයට පත් කිරීමේ කොටසක් වශයෙන් කළ හැකි ය:

එසේ වුවද යම් වරදක් සම්බන්ධයෙන් නඩුවක් ඒ වන විටත් අධිකරණයක පවරා ඇති අවස්ථාවක ඒ සේවා නියුක්තයා විසින් වරද සමථයකට පත් කිරීම මහේස්ත්‍රාත්වරයාගේ එකඟත්විය ඇතිව පමණක් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයට පත් කිරීම—

(අ) දෙපාර්ශ්වයේ ම අත්සන් සහිත ලියවිල්ලකින් මහේස්ත්‍රාත්වරයාට නිවේදනය කරනු ලැබිය යුතු ය;

(ආ) චූදිතයා නිදොස් කිරීමේ ප්‍රතිඵලය ගෙන දිය යුතු ය.

**සොරකම් කරන ලදැයි සැක කෙරෙන භාණ්ඩ සන්තකයේ තබා ගැනීම.**

66ඌ. (1) යම් නිශ්චිත වරායකට ඇතුළු වන අවස්ථාවේ දී තමා සන්තකයේ ඇති සියලු භාණ්ඩ පිළිබඳව නියමිත ආකෘතියෙහි ප්‍රකාශයක් කර, ඒ ප්‍රකාශ භාර ගැනීමට වරායවල් පිළිබඳ අධිකාරිය විසින් බලය දී ඇති නිලධරයාට ඒ ප්‍රකාශ භාරදීම,

එවැනි යම් වරායකට ඇතුළු වන සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශ කරනු නොලැබූ යම් භාණ්ඩයක් යම් තැනැත්තකු සන්තකයේ තිබී හමුවුවහොත්, සොරකම් කරන ලද්දක් නොවන බව ඔප්පු කරනු ලබන තෙක් ඒ භාණ්ඩය සොරකම් කරන ලද දේපළක් ලෙස, පූර්වානුමාන කරනු ලැබිය යුතු ය.

(3) සොරකම් කරන ලදැයි පූර්වානුමාන කරන යම් භාණ්ඩයක්, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යථාපරිදි බලය දෙන ලද නිලධරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ යම් තැනැත්තකු සන්තකයේ තැනහොත් භාරයේ තිබෙනු සොයා ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා රඳවා තබාගෙන, නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා, ආසන්නතම පොලිස් ස්ථානයට ඒ තැනැත්තා භාර දිය හැකි ය.

නරක් විය හැකි දේපළ පිළිබඳව සුදුසු කටයුතු කිරීම.

66එ. (1) මෙහි මින් ඉහත කුමක් සඳහන්ව තිබුණ ද, 66අ වන වගන්තිය යටතේ තහනමට ගන්නා ලද්දා වූ ද ශීඝ්‍රව හා ස්වාභාවිකව නරක් වීමට පත්විය හැකි වූ ද යම් දේපළක් විකිණීමට වරායවල් පිළිබඳ අධිකාරිය විසින් විධාන කළ හැකි අතර, විකිණීමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් ඒ දේපළ නොවිකුණන ලද්දේ නම් ක්‍රියා කළ හැකි වූ ආකාරයට ම ක්‍රියා කළ හැකි ය :

එසේ වුව ද හිමිකම් පාන්නා විසින්, ඒ දේපළෙහි වටිනාකමට සමාන වූ ද වරායවල් පිළිබඳ අධිකාරිය සෑහීමට පත්වන්නා වූ ද ඇපයක් තැබුවහොත්, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අප්‍රමාදව ඒ තහනමට ගැනීම ඉවත් කොට, හිමිකම්පාන්නා විසින් ඒ දේපළ ඉවත් කරගෙන යාම සඳහා ඉඩ දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දේපළ තහනමට ගන්නා ලද්දා වූ ද හිමිකම්පාන්නා නිවැරදිකරු බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවා වූ ද අවස්ථාවක, විකිණීමෙන් ලැබී ඇති මුදල 39 වන වගන්තියේ (6) වන උපවගන්තියේ සඳහන් ගෙවීම් අඩුකර ගැනීමෙන් පසුව, ඒ හිමිකම් පාන්නාට ගෙවිය යුතු ය.

රජය සන්තක කරන ලද දේපළ විකිණිය හැකි බව.

66ඒ. මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක නැතහොත් රීතියක හෝ විධිවිධාන යටතේ රජය සන්තක කරන ලද දේපළ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම නීත්‍යනුකූල වන අතර, ඒ විකිණීමෙන් ලැබෙන මුදල වරායවල් පිළිබඳ අධිකාරිය විසින් 30 වන වගන්තියේ (6) වන උප වගන්තියේ සඳහන් ගෙවීම් කිරීම සඳහා යොදා ගත යුතු ය. යම් ශේෂයක් වේනොත්, එය වරාය වල් පිළිබඳ අධිකාරියේ නැගී අරමුදලට බැර කළ යුතු ය.

වැරදි පිළිබඳ ප්‍රකාශ.

66ඔ. මේ පනත යටතේ ගැනෙන යම් වරදක් සම්බන්ධ යම් පරීක්ෂණයක හෝ වෙනත් නඩු කටයුත්තක ඒ වරද යම් වරායක සීමා ඇතුළත හෝ වරායවල් පිළිබඳ අධිකාරියට අයත් ප්‍රදේශය ඇතුළත සිදු කරන ලදැයි ප්‍රකාශ කිරීම ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ සීමා හෝ වරායවල් පිළිබඳ අධිකාරියට අයත් ප්‍රදේශය පිළිබඳ ඔප්පු කිරීමකින් තොරව, ප්‍රමාණවත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය, එහි (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස යළි අංක යෙදීමෙන් ;

(ආ) එසේ යළි අංක යොදන ලද (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ " යම් සාමාජිකයකු " යන වචන වෙනුවට " යම් අධ්‍යක්ෂවරයකු " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) යළි අංක යොදනු ලැබූ ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

" (2) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව කවර හෝ අධිකරණයක් වෙත ඉදිරිපත් වන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී වරායවල් පිළිබඳ අධිකාරියට දරන්නට සිදුවන යම් වියදමක්, වරායවල් පිළිබඳ අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවන ලද හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු වරායවල් පිළිබඳ අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරනු ලබන නැතහොත් කරනු

ලබන්නේ යැයි ඇඟවෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව කවර හෝ අධිකරණයක ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක් ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවහොත් මිස, ඒ වියදම ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, වරායවල් පිළිබඳ අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "සාමාජිකයකුගේ" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂවරයකුගේ" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සාමාජිකයකුගේ" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂවරයකුගේ" යන වචනය ආදේශ කිරීමෙන්.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 71අ, 71ආ, 71ඇ, සහ 71ඈ යන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 71අ, 71ආ, 71ඇ, සහ 71ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

'වරාය ආරක්ෂක සේවයේ බලතල.

71අ. (1) වරාය ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකු විසින් වරායවල් පිළිබඳ අධිකාරියේ ප්‍රදේශය ඇතුළත දී—

(අ) මේ පනත යටතේ වූ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ වරදක් කරන යම් තැනැත්තකු;

(ආ) යම් තැනැත්තකු වරදක් කරන්නට ආසන්න යයි හෝ වරදක් කර ඇතැයි හෝ සාධාරණ සැකයක් පවත්නා විට එවැනි තැනැත්තකු;

(ඇ) යම් තැනැත්තකු මේ පනත යටතේ වූ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ යම් වරදක් කිරීමට ආධාර හෝ අනුබල දුන්නේ යයි සාධාරණ සැකයක් පවත්නා විට, එවැනි තැනැත්තකු;

(ඈ) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ගෙවල් බිඳීමේ යම් උපකරණයක් තමා භාරයේ හෝ සන්තකයේ තබා ගෙන සිටින නැතහොත් යම් පීඩාකාරී හෝ අන්තරාදායක ආයුධයක් රැගෙන සිටින නැතහොත් වරායවල් පිළිබඳ අධිකාරිය භාරයේ හෝ සන්තකයේ පවත්නා

නැව්බඩු කිසිවක් නීතිවිරෝධී ලෙස ඉවත ගෙන යෑම පිණිස ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි යම් ලියවිල්ලක් ඇතිව සිටින යම් තැනැත්තකු ;

(ඉ) සොරකම් කරන ලද හෝ වංචනිකව ලබා ගත් දේපළ බවට සාධාරණව සැක කරන ලද බඩු තමා සන්තකයෙහි තබාගෙන සිටින්නා වූ ද මේ පනත යටතේ වූ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් යටතේ වූ වරදක් කර ඇත්තේ යැයි සාධාරණව සැක කළ හැකි වූ ද යම් තැනැත්තකු

රඳවා තබා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුව ද, ඒ තැනැත්තා රේගු ආඥා පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය වනසේ ක්‍රියා කර ඇති බව හෝ එසේ ක්‍රියා කරමින් සිටින බව විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, ඒ ආඥාපනතේ විධිවිධාන අනුව ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කරනු පිණිස, ඒ තැනැත්තා රේගු නිලධරයකුට භාර කරනු ලැබිය යුතු ය ; තවද,

(ඊ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වන වගන්තියේ අර්ථානුකූලව වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි වරදක් වන්නා වූ යම් වරදක්, වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානය හෝ ප්‍රදේශය ඇතුළත කරන යම් තැනැත්තකු ;

(උ) වරායවල් පිළිබඳ අධිකාරියට අයත්වන හෝ එය සන්තකයේ පවත්නා යම් දේපළක් සොරකම් කරන හෝ ඒ දේපළ කට අලාභ කරන යම් තැනැත්තකු ;

(ඌ) වරායවල් පිළිබඳ අධිකාරියට අයත්වන හෝ එය සන්තකයේ පවත්නා යම් දේපළක් සොරකම් කළ බව හෝ දේපළ කට අලාභ කළ බව නැතහොත් එසේ සොරකම් කිරීමට හෝ අලාභ කිරීමට ආසන්න බව විශ්වාස කිරීමට හේතු වන අන්දමින් වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානය තුළ හෝ ප්‍රදේශය තුළ සිටින්නා වූ යම් තැනැත්තකු ; හෝ

(එ) තමා පැමිණ සිටින බව සැඟවීමට උත්සාහ ගන්නා බවට පෙනෙන යම් තැනැත්තකු

එසේ රඳවා තබා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු මුදාහරිනු ලැබුවහොත් මිස ඒ තැනැත්තා සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා, අප්‍රමාදව ආසන්නතම පොලිස් ස්ථානයට භාර දෙනු ලැබිය යුතු ය.

(3) වරාය ආරක්ෂක සේවයේ යම් නිලධරයකු විසින්, වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානය ඇතුළත දී වරදක් කළ හෝ වරදක් කිරීමට ආසන්න තැනැත්තකු යයි තමාට විශ්වාස කිරීමට හේතු ඇති යම් තැනැත්තකු හෝ ඒ තැනැත්තාගේ බඩු බාහිරාදිය හෝ යම් වාහනයක් හෝ පරීක්ෂාකර බැලීම නීත්‍යනුකූල වන්නේ ය:

එසේ වුවද, ස්ත්‍රියක් පරීක්ෂා කරනු ලැබීම අවශ්‍ය වන අවස්ථාවක ඒ පරීක්ෂා කිරීම වෙනත් ස්ත්‍රියක් විසින්, ශිෂ්ටත්වය කෙරෙහි දැඩි සැලකිල්ල ඇතිව කරනු ලැබිය යුතු ය.

වරාය ආරක්ෂක සේවයේ සාමාජිකයන්ගේ කාර්යය.

71ආ. (අ) වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළ ආරක්ෂා කිරීම සහ රැක බලා ගැනීම හා යම් නිශ්චිත වරායක නැව් ගමනාගමනයෙහි සුරක්ෂිත භාවය සහතික කිරීම;

(ආ) වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළට බලපාන සියලු අපරාධ, වැරදි, නීති උල්ලංඝනය කිරීම් සහ පීඩා වැළැක්වීම සඳහා තමාගේ උපරිම උත්සාහය සහ දක්ෂතාව යෙදීම;

(ඇ) වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානය හෝ ප්‍රදේශය ඇතුළත සිටින අවිනීත සහ සැක ගෙන දෙන තැනැත්තන් අත් අඩංගුවට ගැනීම;

(ඈ) වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළ ආරක්ෂා කිරීමට සහ රැක බලා ගැනීමට අවශ්‍ය හෝ නියම කරනු ලැබූ හෝ විධාන කරනු ලැබූ වෙනත් යම් දෙයක් කිරීම

වරාය ආරක්ෂක සේවයේ සෑම සාමාජිකයකුගේම කාර්යය විය යුතු ය.

ගින්නක් ඇති වූ අවස්ථාවක වරාය ආරක්ෂක සේවයේ සාමාජිකයන්ගේ කාර්යය.

71ඇ. වරායවල් පිළිබඳ අධිකාරිය ඇතුළත ගිනි හෝ වෙනත් යම් ව්‍යසනයක් ඇති වන සියලු අවස්ථාවන්හි දී, ඒ ස්ථානය තුළ සේවයේ නියුතුව සිටින වරාය ආරක්ෂක සේවයේ සෑම සාමාජිකයකු විසින් ඉන් අනතුරට භාජන විය හැකි තැනැත්තන් සහ දේපළ ආරක්ෂා කිරීමට පියවර ගනු ලැබිය යුතු ය.

වැඩ වර්ජන ක්‍රියාවල යෙදීම.

71ඈ. වරාය ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකු විසින් වැඩ වර්ජන ක්‍රියාවක යෙදීම නීත්‍යානුකූල නොවන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "වැඩ වර්ජන" යන්නෙහි, වෘත්තීය සමිති ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ යාත්‍රාවෙහි ආනයනය කරන ලද සියලුම බඩු අවසාන වශයෙන් බෑමෙන් පසු ඊළඟ දින දහහතර ඇතුළත" යන වචන වෙනුවට "ඒ යාත්‍රාව ආනයනය කරන ලද බඩු සහිතව වරායට පැමිණීමෙන් පසු පැය විසිහතරක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ, 84ආ, 84ඇ, 84ඈ, 84ඉ, 84ඊ හා 84උ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ, 84ආ, 84ඇ, 84ඈ, 84ඉ, 84ඊ සහ 84උ යන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:—

"යාත්‍රා සම්බන්ධයෙන් වරාය අධිපතිවරයාගේ බලතල.

84අ. වරාය අධිපතිවරයා විසින්—

(අ) යම් නිශ්චිත වරායක් තුළ හා ඒ වරායේ ප්‍රවේශ මාර්ගවල කවර තැනක යම් යාත්‍රාවක් නවතා තැබීම හෝ නැංගුරම්ලෑම කළ යුත්තේ ද යන වග ද ඒ නැංගුරම්ලෑම කළ යුතු ආකාරය ද විධාන කිරීම;

(ආ) යම් යාත්‍රාවක් නවතා තැබූ ස්ථානයකින්, නැවතුම් පොළකින් හෝ නැංගුරම්ලෑ ස්ථානයකින් වෙනත් නවතා තබන ස්ථානයකට, නැවතුම් පොළකට හෝ නැංගුරම්ලන ස්ථානයකට ඉවත් කිරීම සහ යම් නිශ්චිත වරායක් තුළ හා ඒ වරායේ ප්‍රවේශ මාර්ගවල ඒ ඉවත් කිරීම කරනු ලැබිය යුතු කාලය විධාන කිරීම; සහ

(ඇ) යම් නිශ්චිත වරායක් තුළ හා ඒ වරායේ ප්‍රවේශ මාර්ගවල යාත්‍රා ගමනාගමනය විධිමත් කිරීම

කරනු ලැබිය හැකි ය.

යාත්‍රාවල ඇතිවන ගිනි.

84ආ. (1) යම් නිශ්චිත වරායක් තුළ වූ යාත්‍රාවක ගින්නක් ඇතිවුණු අවස්ථාවක, සුදුසු යයි තමා අදහස් කරන ආධාර ද තැනැත්තන් ද සමග ඒ යාත්‍රාවට පිවිසීම ද ඒ යාත්‍රාව ගිලාබැස්සවීම සඳහා හෝ වෙනත් යම් යාත්‍රාවකට අලාභහානි සිදුවීම වළක්වාලීම පිණිස තමාට සුදුසු යයි අදහස් කරන වෙනත් ස්ථානයකට ඒ යාත්‍රාව හෝ වෙනත් යම් යාත්‍රාවක් ඉවත් කිරීම සඳහා හෝ ජීවිත හෝ

දේපළ ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය යයි තමාට පෙනෙන වෙනත් යම් පියවර ගැනීම සඳහා හෝ අවශ්‍ය යයි තමා කල්පනා කරන විධාන දීම ද වරාය අධිපතිවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) ඒ විධාන ඒ යාත්‍රාවේ නෞකාධිපති විසින් වහාම ඉටු නොකරනු ලැබුවේ නම්, ඒවා ක්‍රියාත්මක කිරීම වරාය අධිපතිවරයා විසින් ම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උප වගන්තිවලින් පිරිනැමී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන ලද යම් වියදමක්, ඒ යාත්‍රාවේ නෞකාධිපතිගෙන් හෝ අයිතිකරුගෙන් අයවිය යුතු ණයක් ලෙස ඒ නෞකාධිපතිගෙන් හෝ අයිතිකරුගෙන් අය කරගනු ලැබිය හැකි විය යුතු ය.

යාත්‍රාවලට ඇතුල්වීමට ඇති බලය.

84ඇ. (1) යම් යාත්‍රාවක් තුළ මේ පනත යටතේ යම් වරදක් කර ඇති බව හෝ කිරීමට ආසන්න බව හෝ වරාය අධිපතිවරයා හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යථා පරිදි බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් සැක කරනු ලබන අවස්ථාවක, නැත හොත් මේ පනත යටතේ යම් කාර්යයක් ඉටු කිරීමේ දී යාත්‍රාවකට ඇතුල්වීම අවශ්‍ය යයි තමා සලකන්නේ නම් එවැනි අවස්ථාවක නියමිත වරායක් තුළ වූ යම් යාත්‍රාවකට ඇතුල්වීම වරාය අධිපතිවරයාට හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින් කළ හැකි ය.

(2) වරාය අධිපතිවරයාට හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යථා පරිදි බලය දෙන ලද යම් නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට එවැනි යාත්‍රාවකට ඇතුල්වීමට ඉඩදීම නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන ඒ යාත්‍රාවේ යම් නෞකාධිපතිවරයකු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ වගකීමෙන් නිදහස් බව.

84ඈ. වරාය අධිපතිවරයාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය වග නොකිව යුතු ය.

යාත්‍රාව නියමු කාර්ය යටතේ තිබිය දී නෞකාධිපතිගේ සහ අයිතිකරුගේ වගකීම.

84ඉ. නියමු කාර්ය අනිවාර්ය වූ අවස්ථාගත කරුණු යටතේ සංතරණය කෙරෙන යාත්‍රාවක නෞකාධිපති හෝ අයිතිකරු, ඒ යාත්‍රාව නිසා සිදු වන අලාභයකට හෝ හානියකට නියමු කාර්ය අනිවාර්ය නොවූවාක් මෙන් වගකිව යුතු ය.

බැඳුම්කරය දී ඇති විට නියමුවාගේ වගකීම සීමා කිරීම.

84ඊ. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තිය අනුව බැඳුම්කරයක් දී ඇති වරායවල් පිළිබඳ අධිකාරියේ නියමුවකු නොසැලකිල්ල, අදක්ෂතාව හෝ තනතුරෙහි සිටිය දී නුසුදුසු වීම සම්බන්ධයෙන්, ඒ බැඳුම්කරයෙහි දැක්වෙන දණ්ඩනයේ ප්‍රමාණයට සහ ඔහු එසේ යටත් වන අවස්ථාවේ දී ඔහු යෙදී සිටි ගමන සම්බන්ධයෙන් නියමු කාර්ය වෙනුවෙන් වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවිය යුතු මුදල් ඉක්මවන ප්‍රමාණයකට යටත් නොවිය යුතු ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ සෑම නියමුවකු විසින්ම, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ හෝ තමා වෙත පැවරී ඇති කාර්ය නිසියාකාර ඉටුකරන බවට, වරායවල් පිළිබඳ අධිකාරියේ නමට රුපියල් දස දහසක් වූ මුදලකට බැඳුම්කරයක් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් බැඳුම්කරය මුද්දර බද්දට යටත් නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර වගකීම සීමා කරනු ලැබූ යම් නොසැලකිල්ලක්, අදක්ෂතාවක් හෝ තනතුරෙහි සිටිය දී නුසුදුසුවීමක් සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියේ නියමුවකුට විරුද්ධව යම් නඩු කටයුත්තක් පැවරුණු අවස්ථාවක සහ ඒ නොසැලකිල්ල, අදක්ෂතාව හෝ තනතුරෙහි සිටිය දී නුසුදුසුවීම සම්බන්ධයෙන් වෙනත් හිමිකම්පෑම් කර ඇති අවස්ථාවක, නඩු කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අධිකරණය විසින්—

(අ) නියමුවාගේ වගකීමේ ප්‍රමාණය තීරණය කිරීම ද ඔහු විසින් ඒ මුදල අධිකරණයට ගෙවනු ලැබූ කල්හි, එය ඒ ඒ හිමිකම් පාන්නන් අතර ප්‍රමාණානුකූලව බෙදා දීම ද කරනු ලැබිය හැකි ය;

(ආ) නඩු කටයුත්තට සම්බන්ධතාවක් ඇති තැනැත්තන් පාර්ශ්වකරුවන් කරනු පිණිස ද, දවස් තිහක කාලයක් ඇතුළත සිය හිමිකම් ඉදිරිපත් කර නොමැති යම් හිමිකම් පාන්නන් බැහැර කිරීම පිණිස ද නියමුවා විසින් ඇප තැබීම නියම කිරීම පිණිස ද යම් නඩු ගාස්තු ගෙවීම පිණිස ද අධිකරණය සුදුසු යයි කල්පනා කරන ආකාරයෙන් සහ විධානවලට යටත්ව ක්‍රියා කළ හැකි ය.

**නියමුවන් ගෙන් සිදුවන අලාභ හෝ හානි පිළිබඳව වරායවල් පිළිබඳ අධිකාරිය වග නොකියන බව.**

84උ. යම් නියමු කාර්යයක යොදවනු ලබන වරායවල් පිළිබඳ අධිකාරියේ යම් නියමුවකු, ඔහු වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති තැනැත්තකු වන නමුත්, නියමු කාර්යයට භාජනව ඇති යාත්‍රාවේ නෞකාධිපතිගේ හෝ අයිතිකරුගේ පමණක් සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ නියමුවාගේ ක්‍රියාවකින්, නොකර හැරීමකින් හෝ පැහැර හැරීමකින් සිදු වූ යම් අලාභයක් හෝ හානියක් සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය වගකීමට යටත් නොවිය යුතුය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "15 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "15 වන, 109 වන හා 110 වන වගන්ති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) "යාත්‍රාව" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

'"වරාය අධිපතිවරයා" යන්නෙන් 14අ වගන්තිය යටතේ පත් කරන ලද වරාය අධිපතිවරයා අදහස් වන අතර, යම් නියෝජ්‍ය වරාය අධිපතිවරයකු ඊට ඇතුළත් වේ;';

(ආ) "ඉඩම" යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

'"ඉඩම" යන්නට ජලයෙන් වැසුණු බිමක් සහ ඉඩම් පිළිබඳ වූ යම් සම්බන්ධතාවක් ද පොළවට ඈඳුණු හෝ ස්ථිරව සවි වූ දේවල් ද ඇතුළත් වේ.'.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය සංශෝධනය කිරීම.**

(අ) ඒ උපලේඛනයේ "සාමාජිකයා" හෝ "සාමාජිකයන්" යන වචන යෙදෙන කවර හෝ තැනක පිළිවෙලින් "අධ්‍යක්ෂවරයා" හෝ "අධ්‍යක්ෂවරයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපලේඛනයේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ප්‍රධාන රේගු අයකැමි" යන වචන වෙනුවට, "කළමනාකාර අධ්‍යක්ෂ, ප්‍රධාන රේගු අයකැමි" යන වචන ආදේශ කිරීමෙන්.

**33.** මේ පනතේ 9, 10, 11, 12, 13, 14, 15 සහ 16 යන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධන, එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයේ දී ම බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**ඇතැම් සංශෝධන අතීතයට බලපෑම.**

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර ආයක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.